# ගුවන්යානා පදවන කලාලැදි තරුණයා - ශිමල්



ශිමල් තනිව පැදවූ ගුවන්යානය සමග කැලිපෝනියාවේදී

**මී**ගමුවේ උපන් ශිමල් ලිවේරා කුඩා කාලයේදී ම තම දෙමව්පියන් සමග ඉතාලියට ගොස් ඉතාලි බසින් ප්‍රාථමික අධ්‍යාපනය ලැබුවේ ය. පසුව ඔහු වැඩිදුර අධ්‍යාපනය සඳහා එක්සත් රාජධානියට පැමිණි ඔහු මෙහි කිංස්ටන් විශ්ව විද්‍යාලයට ඇතුල් ව ගුවන් යානා නඩත්තු කිරීම පිළිබඳව පාඨමාලාවක් හැදෑරූ වේය. කුඩාකල සිටම ගුවන් නියමුවෙකු වීමේ ආශාවෙන් පසුවූ ශිමල් විශ්වවිද්‍යාල පාඨමාලාව අතරමග නතර කොට මෑතදී ඇමරිකාවේ කැලපෝනියාව බලා පිටත්වී ගියේ තම සිහිනය මුදුන් පමුණුවාගන්නා අටියෙනි ඒ සම්බන්ධව හදාරමින් පසුගිය දිනෙක ඔහු උපදේශකයෙකු නොමැතිවම තනිවම ගුවන් යානයක් පියාසර කරවූ බව අපට දැනගන්නට ලැබිණ.

ඉතාලියේ සිට එක්සත් රාජධානියට ආ මුල් අවධියේ ශිමල් ලන්ඩනයේ නොටයකුත් සංගීත කණ්ඩායම්වලට එකතු වී සංගීත වේදියෙක් හැටියට ද කටයුතුකර ඇත. ඔහු ලන්ඩනයේ සුප්‍රකට කලාකාරියක වන ලිලානි පෙරේරා නිශ්පාදනය කළ, ප්‍රවීන නිළි මාලිනී පොන්සේකා අධ්‍යක්ෂණය කළ, සුරඟන දුව නම් ටෙලි වෘතාන්තයේද චරිතයක් නිරූපණය කළේය.

විවිධ දක්ෂතා ඇති ශිමල්ට සිය ආශාව පරිදි ගුවන් නියමුවෙකු වීමේ වරප්‍රසාදය ඉක්මණින්ම ලැබේවායි අපේ ආශීර්වාදය මෙයින් සටහන් කරමු.

♦ ***විල්ප්‍රඩ් පෙරේරා***
**Berks UK**



ශිමල් (මැද) ඉෂාක් බෙග් සහ චන්දන ලියනාරච්චි ගායන ශිල්පීන් සමග ඔවුන් ලන්ඩනයට ආ දවසක හමුවී



# කොටි ත්‍රස්තවාදීන් දළදා මාලිගාවට කළ විනාශය ලන්ඩනයේ දී සිහිපත් කරති

**ශ්‍රී** ලංකාවේ දෙමළ කොටි ත්‍රස්තවාදීන් විසින් සිංහල බෞද්ධයාගේ හදවත වන් දළදා මාළිගාවට **1998** ජනවාරි **25** වෙනි දින අළුයම දැවැන්ත බෝම්බ පුපුරවා හැරීමකින් සිදු කළ මහා විනාශයේදී එදින උදෑසන පූජාවට පැමිණ සිටි අතදරුවෙකු සමග සැදැහැවතුන් **8** දෙනෙකුද මියගිය අතර, **25** දෙනෙකුට අධික පිරිසකට බරපතල තුවාල සිදුවීය. දළදා මාළිගාවේ ඉදිරිපසද පොඩි පට්ටම් වීමෙන්ද, විෂ්ණු, නාථ හා පත්තිනි දේවාලද කැඩී බිඳී ගියේය. ඇතුළත පිළිම වහන්සේලාද ඒ මේ අත විසිරී බිඳී තිබුණද ආශ්චර්‍යයකට මෙන් අභ්‍යන්තර ගර්භයක තැන්පත්කර තිබුණු දළදා වහන්සේට කිසිදු හානියක් සිදු නොවීය.

මෙම සිත් පිත් නැති විනාශය පමණක් නොව කොටි ත්‍රස්තවාදීන් විසින් ශ්‍රීලංකාව තුළ සිදු කළ අනේක මිනිස් ඝාතන අතර භික්ෂූන් වහන්සේලා මරාදැමීමද, ශ්‍රී මහාබෝධීන් වහන්සේට කළ විනාශයද ඇතුළුව සිද්ධීන් ගණනාවක් වාර්ෂිකව සිහිපත්කරන මහා සභා රැස්වීම මෙවර ද ජාතිමාමක ***කරුණා බස්නායක මහතා*** ප්‍රමුඛ ලන්ඩනයේ වෙසෙන ජාති හිතෛෂී පිරිසකගේ එකමිතියෙන් ලන්ඩනයේ දී පැවැත්වේ.

**2009 ජනවාරි 25 වෙනි ඉරිදා**
**සවස 2 සිට 530 දක්වා**
**Interchange Community Hall**
**Old Town Hall, Rosslyn Hill, London NW3**
**( Just near Belsize Park Tube Station)**

# Lady Finger, Bhindi, or Bandakka is 'OKRA'

**Last week, while travelling on London underground, I read the following in Big Issue magazine. It was all about බණ්ඩක්කා**

Last month in one of TV program I learnt of a treatment of Sugar (Diabetes). Since I am diabetic, I tried it and it was very useful and my Sugar is in control now. In fact I have already reduced my medicine.

Take two pieces of Lady Finger (Bhindi) and remove/cut both ends of each piece. Also put a small cut in the middle and put these two pieces in glass of water. Cover the glass and keep it at room temperature during night. Early morning, before breakfast simply remove two pieces of lady finger (bhindi) from the glass and drink that water.

Keep doing it on daily basis. Within two weeks, you will see remarkable results in reduction of your SUGAR.

My sister has got rid of her diabetes. She was on Insulin for a few years, but after taking the lady fingers every morning for a few months, she has stopped Insulin but continues to take the lady fingers every day. But she chops the lady fingers into fine pieces in the night, adds the water and drinks it all up the next morning. Please. try it as it will not do you any harm even if it does not do much good to you, but Uhave to keep taking it for a few months before U see results, as most cases might be chronic.



# බණ්ඩක්කා

**මෙහි** වම්පස පළවන ඉංග්‍රීසි ලිපියෙහි පුවත නම් බණ්ඩක්කා දියවැඩියා රෝගීන්ට ගුණදායක බවයි. එහි ශරීරයේ සීනි ප්‍රමාණය අඩු කරන ගුණයක් ඇති බවයි. බණ්ඩක්කා කරලක් කැබලි වලට කපා වතුර වීදුරුවක දමා මුළු රැයක්ම වසා තබා උදේ නැගිට බණ්ඩක්කා කැබලි ඉවත්කර හිස්බඩම එම වතුර පානය කළ යුතු ය. එසේ දිගටම මාසයක් කිරීමෙන් ශරීරයේ පවතින සීනි ප්‍රමාණය අඩුවන බවක් පෙනෙන්නේ යයි එහි සඳහන් වෙයි.




HolidayAir
A Travel Experience to Remember
Amazing Srilanka 2009 Flight Sale !
Fly to Sri Lanka
SriLankan £340 +Taxes
QATAR AIRWAYS £193 +Taxes
KUWAIT AIRWAYS £290 +Taxes
KINGFISHER £310 +Taxes
SriLankan £470* +Taxes
* Free stopover India / Hong Kong / Tokyo / Beijing / Singapore / Bangkok / Kuala Lumpur
Unbeatable worldwide fares now available on our 24-hour online booking system
www.holidayair.com
MCG
IATA
New Phone Number & Address
0208 4400 770
96 High Street, Barnet, Herts EN5 5SN
India £199 +Taxes
Far East £225 +Taxes
Australia £450 +Taxes
USA/Canada £99 +Taxes
*Terms and Conditions Apply **Date-Specific Promotional Fare